# මාධ්‍ය නිවේදනය

## කාර්මික නිෂ්පාදන දර්ශකය : 2017 අගෝස්තු

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011 - 2147401** **ෆැක්ස්: 011-2147412** **2017 ඔක්තෝබර් 12**

2016 වර්ෂයේ අගෝස්තු මස නිෂ්පාදනයට සාපේක්ෂව, 2017 අගෝස්තු මස නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි, නිෂ්පාදන ධාරිතාවයෙහි 4.8% ක වැඩිවීමක් වාර්තා වන බව 2017 අගෝස්තු මසට අදාළ කාර්මික නිෂ්පාදන දර්ශකය නිකුත් කිරීමේ නිල නිවේදනය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා ප්‍රකාශ කළේ ය.

ආර්ථිකයේ බොහෝ අංශ වලට අදාළ දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ ප්‍රචාරණය කිරීම ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මෙම දත්ත ආර්ථිකයේ ප්‍රවණතා හඳුනා ගැනීමට, ආර්ථික වර්ධනය මෙහෙයවන ප්‍රධාන අංශ හඳුනා ගැනීමට, ආර්ථික ක්‍රියාකාරිත්වය ඇගයීමට, ප්‍රතිපත්ති සම්පාදනයට හා ඇගයීමට රජය මෙන්ම කර්මාන්තායතන ද භාවිත කරනු ලැබේ. ඒ අනුව නිශ්චිත යොමු කාලයකට සාපේක්ෂව, දෙන ලද කාල පරිච්ඡේදයක දී ආර්ථිකයේ කර්මාන්ත අංශයෙහි ස්වරූපය පිළිබඳ හඳුනා ගැනීම කාර්මික නිෂ්පාදන දර්ශකය මඟින් සිදු කෙරේ. තව ද මෙමඟින් කර්මාන්ත අංශයේ කෙටි කාලීන වෙනස්කම් ද හඳුනා ගත හැකිය.

ඒ අනුව 2016 අගෝස්තු මස මාසික නිෂ්පාදන ධාරිතාවයට සාපේක්ෂව 2017 අගෝස්තු මස 'පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන' (35.5%), 'මූලික ලෝහ නිෂ්පාදන' (18.9%), සහ 'අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන' (10.4%) වල කැපී පෙනෙන වර්ධනයක් වාර්තා වේ. 2017 අගෝස්තු මස ආහාර නිෂ්පාදන අංශයෙහි නිෂ්පාදනය 5.1% ක වැඩිවීමක් වාර්තා වේ.

**කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100)**

| මාසය / වර්ෂය | දර්ශක අගය |
|---|---|
| 2016 අගෝස්තු | 103.6 |
| 2017 අගෝස්තු | 108.6 |
| ප්‍රතිශතක වෙනස (%) | 4.8 |

තව ද, 'බීම වර්ග නිෂ්පාදන', 'ගෘහ භාණ්ඩ නිෂ්පාදන' සහ 'රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' වල 2016 වර්ෂයේ අගෝස්තු මස නිෂ්පාදනයට සාපේක්ෂව පිළිවෙලින් 16.4%, 6.9% සහ 2.5% ක අඩුවීමක් වාර්තා විය.

මේ පිළිබඳව වැඩි විස්තර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත. ( www.statistics.gov.lk/Industries)